# රාජ්‍ය සේවා කොමිෂන් සභාව

## ශ්‍රී ලංකා පරිපාලන සේවයෙහි II ශ්‍රේණියේ නිලධාරීන් I ශ්‍රේණියට උසස් කිරීම

අංක 1842/2 හා 2013.12.23 දිනැති අති විශේෂ ගැසට් පත්‍රයෙන් ප්‍රකාශයට පත් කරනු ලැබූ ශ්‍රී ලංකා පරිපාලන සේවා ව්‍යවස්ථා සංග්‍රහයට අංක 2137/5 හා 2019.08.19 දිනැතිව කරන ලද හයවන සංශෝධනය ක්‍රියාත්මක වන 2019 පෙබරවාරි 26 දිනට, II ශ්‍රේණියේ සිටින නිලධාරීන් හා 2019.02.26 වැනි දින හෝ ඊට පසු II ශ්‍රේණියට උසස් වී ඇති නිලධාරීන්ගෙන්, රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 31/2019 හා 2019.10.04 දිනැති චක්‍රලේඛයේ විධිවිධාන පරිදි I ශ්‍රේණියට උසස් කිරීම සඳහා අයදුම්පත් කැඳවනු ලැබේ.

02. **I ශ්‍රේණියට උසස් කිරීම සඳහා සපුරාලිය යුතු සුදුසුකම් හා උසස් කිරීමේ ක්‍රමය**

පහත සුදුසුකම් සම්පූර්ණ කරන ලද නිලධරයන් සම්මුඛ පරීක්ෂණයට භාජන කර උසස් කරනු ලැබේ.

I. විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගෙන ඇති විශ්වවිද්‍යාලයකින් හෝ උපාධි ප්‍රදානය කිරීමේ ආයතනයකින් පිරිනමනු ලබන රාජ්‍ය පරිපාලනය, කළමනාකරණය, රාජ්‍ය ප්‍රතිපත්ති, මානව සම්පත් කළමනාකරණය, ආර්ථික විද්‍යාව, සංවර්ධන ආර්ථික විද්‍යාව, සමාජ සංවර්ධනය, නීතිය, මූල්‍ය කළමනාකරණය, ව්‍යාපෘති සැළසුම්කරණය හා කළමනාකරණය, තොරතුරු තාක්ෂණය යන විෂය ක්ෂේත්‍රයන්ගෙන් හෝ ශ්‍රී ලංකා පරිපාලන සේවයේ නිලධාරීන්ට පැවරෙන බහුවිධ කළමනාකරණ කාර්ය භාරය ඉටු කිරීම පිණිස අවශ්‍ය දැනුම හා කුසලතාවය ලබා ගැනීම සඳහා යෝග්‍ය යැයි ශ්‍රී ලංකා පරිපාලන සේවා විෂය භාර අමාත්‍යාංශයේ ලේකම්වරයාගේ නිර්දේශය මත රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් අනුමත කරනු ලබන වෙනත් විෂය ක්ෂේත්‍රයන් අතුරින් හෝ අවම වශයෙන් එක් විෂය ක්ෂේත්‍රයකට අදාළව පශ්චාත් උපාධියක් ලබා තිබීම.

II. අනුමත කාර්ය සාධන ඇගයීම් පටිපාටිය අනුව උසස් කිරීමේ දිනට පෙරාතුව වූ වසර හය (06)ක් තුළ සතුටුදායක මට්ටමේ හෝ ඊට ඉහළ කාර්ය සාධනයක් පෙන්නුම් කර තිබීම හා වැටුප් වර්ධක හය (06)ක් උපයාගෙන තිබීම.

III. II වන කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණය නියමිත දිනට සම්පූර්ණ කර තිබීම.

IV. ශ්‍රී ලංකා සංවර්ධන පරිපාලන ආයතනය විසින් පවත්වනු ලබන ධාරිතා සංවර්ධන මට්ටම III පාඨමාලාව සාර්ථකව සම්පූර්ණ කර සහතිකය ලබා තිබීම.

V. 2019.02.26 දිනට II ශ්‍රේණියේ සිටින නිලධාරීන් හා 2019.02.26 වැනි දින හෝ ඊට පසු II ශ්‍රේණියට උසස් වී ඇති නිලධාරීන්, III හා II ශ්‍රේණිවල වසර 12ක සක්‍රීය හා සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කර තිබීම.

VI. රාජ්‍ය සේවා කොමිෂන් සභා චක්‍ර ලේඛ අංක : 01/2020 හි සඳහන් විධිවිධානයන්ට අනුව විනයානුකූල දඬුවම් ලබා නොතිබීම.

03. ඉහත 02 හි සුදුසුකම් සම්පූර්ණ කර ඇති නිලධාරීන් මේ සමග වන ආකෘතිය අනුව සම්පූර්ණ කරන ලද අයදුම්පත අමාත්‍යාංශ ලේකම්වරුන්, දෙපාර්තමේන්තු ප්‍රධානීන් මගින් රාජ්‍ය සේවා පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශ ලේකම් වෙත 2021.03.12 දිනට පෙර ලැබෙන සේ එවිය යුතුය. එදිනට පසුව එවන අයදුම්පත් කිසිදු හේතුවක් මත භාරගනු නොලබන අතර සදොස්ව හා අසම්පූර්ණව එවන අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ.

04. දැනට විශ්‍රාම ගෙන සිටියේ වුවද උසස්වීම් ලැබීමට සුදුසුකම් ලබන දින තෙක් සේවයේ යෙදී සිටි සහ උසස් වීමට ඉහත 02 ඡේදයේ සඳහන් සුදුසුකම් සපුරා ඇති නිලධාරීන්හට මෙම උසස් වීම් සඳහා ඉල්ලුම් කළ හැකිය.

05. අදාළ ඉල්ලුම්පත www.pubad.gov.lk ඔස්සේ ලබා ගත හැකිය.

රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ අණ පරිදි,

දිනය : 2021.02.22

ජේ.ජේ. රත්නසිරි
ලේකම්
රාජ්‍ය සේවා, පළාත් සභා හා
පළාත් පාලන අමාත්‍යාංශය

**ශ්‍රී ලංකා පරිපාලන සේවයේ II ශ්‍රේණියේ නිලධාරීන් I ශ්‍රේණියට උසස් කිරීම සඳහා අයදුම්පත**

කාර්යාලයීය ප්‍රයෝජනය පිණිසයි -

| |
|---|
| S |
| F |

**(අ) කොටස - නිලධාරියා විසින් සම්පූර්ණ කළ යුතුය.**

1. නම
   1.1. සම්පූර්ණ නම :- ........................................................................................................................
   ........................................................................................................................මෙය/මයා/මිය
   1.2. පත්වීම් ලිපියෙහි සඳහන් නම :- ........................................................................................................

2. ජාතික හැඳුනුම්පත් අංකය :-

| | | | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| | | | | | | | | | | | |

3. උපන් දිනය :-

| | | | | | | | |
|---|---|---|---|---|---|---|---|
| D | D | M | M | Y | Y | Y | Y |

4. පෞද්ගලික ලිපිනය :- ........................................................................................................................
   ........................................................................................................................

5. දුරකථන අංකය :-

| | | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|
| 5.1. නිවස :- | | | | | | | | | | |
| 5.2. ජංගම :- | | | | | | | | | | |

6. විද්‍යුත් තැපැල් ලිපිනය :- ........................................................................................................................

7. තනතුර (දැනට දරන / විශ්‍රාමික නම් විශ්‍රාම ගනු ලැබූ අවස්ථාවේදී දැරූ තනතුර) :- ..................................................
   ........................................................................................................................
   7.1. විශ්‍රාමික නම් විශ්‍රාම ලැබූ දිනය :- ........................................................................................................

8. සේවා ස්ථානය පිළිබඳ තොරතුරු
   8.1. අමාත්‍යාංශය :- ........................................................................................................................
   8.2. දෙපාර්තමේන්තුව -: ........................................................................................................................
   8.3. ලිපිනය -: ........................................................................................................................

| | | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|
| 8.4. දුරකථන අංකය :- | | | | | | | | | | |
| 8.5. ෆැක්ස් අංකය :- | | | | | | | | | | |

9. ශ්‍රී ලංකා පරිපාලන සේවයේ
   9.1. III ශ්‍රේණියට පත්වීම් ලබා ඇති දිනය :- .................................................
   9.2. II ශ්‍රේණියට උසස්වීම් ලබා ඇති දිනය :- .................................................
   (කරුණාකර II ශ්‍රේණියට උසස්වීම් ලද ලිපියේ සහතික කළ පිටපත 9.2 ලෙස අංක කර ඉදිරිපත් කරන්න)

10. ශ්‍රී ලංකා පරිපාලන සේවයේ සේවා ව්‍යවස්ථාවේ 13.2 (අ) හි අනු අංක 01 යටතේ සඳහන් සුදුසුකම් සම්පූර්ණ කිරීම පිළිබඳ විස්තර

| අනු අංකය | පශ්චාත් උපාධි පාඨමාලාවේ නම | විෂයය ක්ෂේත්‍රය | එම උපාධිය පිරිනමන ලද විශ්ව විද්‍යාලය | එම විශ්වවිද්‍යාලය, විශ්විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගෙන ඇති විශ්වවිද්‍යාලයක් හෝ උපාධි ප්‍රදානය කිරීමේ ආයතනයක් වශයෙන් විශ්විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගෙන තිබේද යන වග | උපාධිලාභී වූ වර්ෂය |
|---|---|---|---|---|---|
| | | | | | |
| | | | | | |

(කරුණාකර උපාධි සහතිකයේ සහ විස්තරාත්මක ප්‍රතිඵල සටහනෙහි සහතික කළ පිටපත 10 ලෙස අංක කර ඉදිරිපත් කරන්න)

11. II වන කාර්යක්ෂමතා කඩඉම් විභාගය සමත් වී ඇති දිනය :- ..........................................................
(කරුණාකර විභාග ප්‍රතිඵල ලේඛනයේ සහතික කළ පිටපත 11 ලෙස අංක කර ඉදිරිපත් කරන්න)

12. ශ්‍රී ලංකා සංවර්ධන පරිපාලන ආයතනය විසින් පවත්වනු ලබන ධාරිතා සංවර්ධන මට්ටම - III පාඨමාලාව සම්පූර්ණ කර ඇති දිනය :- ..............................................................
(කරුණාකර ධාරිතා සංවර්ධන මට්ටම - III පාඨමාලාව සම්පූර්ණ කරන ලද බවට වන සහතික පත්‍රයේ සහතික කළ පිටපත 12 ලෙස අංක කර ඉදිරිපත් කරන්න)

උසස් වීමට සුදුසුකම් ලබන දිනට සේවයේ වසර දොළහකට (12) නොඅඩු සක්‍රීය සේවා කාලයක් සම්පූර්ණ කර ඇති බවත්, ඉහත අංක 01 සිට 12 තෙක් නිරවද්‍ය හා සම්පූර්ණ තොරතුරු සහිත ඉල්ලුම්පත ඒ සමග අමුණා එවන ලෙසත් සඳහන් කර ඇති සියලු ලේඛන වල සහතික කළ, පිටපත්, එක් එක් කරුණට අදාළ අංකය එම ලේඛන වල දකුණු ඉහළ කෙළවරෙහි සටහන් කර, අංක පිළිවෙලින් අමුණා ගොනුවක් වශයෙන් සකස් කර, මේ සමග ඉදිරිපත් කරන බවත් සඳහන් කරමි.

| | |
|---|---|
| ................................................ | ................................................ |
| දිනය | ඉල්ලුම්කරුගේ අත්සන<br>තනතුරු නාමය සහ නිල මුද්‍රාව |

**(ආ) කොටස - දෙපාර්තමේන්තු / ආයතන ප්‍රධානියා විසින් සම්පූර්ණ කළ යුතුය.**

ලේකම්,

.................................................................................................................................................................

........................................................................................................................... මහතා/මහත්මිය/මෙනවිය

.......................................................................................................................... දෙපාර්තමේන්තුවේ/අමාත්‍යාංශයේ

.............................................................................................................................. ලෙස සේවය කරනු ලබන බවත්,

1. පත්වීම් දින සිට වසර දොළහක (12) කාලය තුළ සතුටුදායක සේවයක් සම්පූර්ණ කර **ඇති බවත් /** නැති බවත්,

2. I ශ්‍රේණියට උසස් කිරීමේ දිනට පෙරාතුව වූ වසර 11 ක කාලය තුළ සියලුම වැටුප් වර්ධක උපයාගෙන **ඇති බවත් /** නැති **බවත්,**

   2.1. වගු අංක 01

| අනු අංකය | **වර්ෂය** | **වැටුප් වර්ධක නියමිත දිනට උපයාගෙන ඇති /නැති බව** | **වැටුප් වර්ධක දිනය** |
|---|---|---|---|
| i. | 2020 | උපයාගෙන ඇත /නැත | |
| ii. | 2019 | උපයාගෙන ඇත /නැත | |
| iii. | 2018 | උපයාගෙන ඇත /නැත | |
| iv. | 2017 | උපයාගෙන ඇත /නැත | |
| v. | 2016 | උපයාගෙන ඇත /නැත | |
| vi. | 2015 | උපයාගෙන ඇත /නැත | |
| vii. | 2014 | උපයාගෙන ඇත /නැත | |
| viii. | 2013 | උපයාගෙන ඇත /නැත | |
| ix. | 2012 | උපයාගෙන ඇත /නැත | |
| x. | 2011 | උපයාගෙන ඇත /නැත | |
| xi. | 2010 | උපයාගෙන ඇත /නැත | |

(කරුණාකර වැටුප් වර්ධක පත්‍රිකාවන්හි (වසර 11) සහතික කළ පිටපත් වර්ෂ අනුව පිළිවෙලින් අමුණන්න.)

3. අනුමත කාර්ය සාධන ඇගයීම් පටිපාටිය අනුව උසස් කිරීමේ දිනට පෙරාතුව වූ වසර හය (06) තුළ සතුටුදායක මට්ටමේ හෝ ඊට ඉහළ කාර්ය සාධනයක් පෙන්නුම් කර **ඇති බවත්/ නැති බවත්,**

   3.1. වගු අංක 02

| අනු අංකය | **වර්ෂය** | **අවසාන ඇගයුම** | **අදාළ නිලධාරියා විසින් අත්සන් තබා ඇති/නැති බව** |
|---|---|---|---|
| i. | 2020 | විශිෂ්ඨයි / සාමාන්‍ය ප්‍රමාණයට වඩා ඉහළයි / සතුටුදායකයි / අසතුටුදායකයි | ඇත / නැත |
| ii. | 2019 | විශිෂ්ඨයි / සාමාන්‍ය ප්‍රමාණයට වඩා ඉහළයි / සතුටුදායකයි / අසතුටුදායකයි | ඇත / නැත |
| iii. | 2018 | විශිෂ්ඨයි / සාමාන්‍ය ප්‍රමාණයට වඩා ඉහළයි / සතුටුදායකයි / අසතුටුදායකයි | ඇත / නැත |
| iv. | 2017 | විශිෂ්ඨයි / සාමාන්‍ය ප්‍රමාණයට වඩා ඉහළයි / සතුටුදායකයි / අසතුටුදායකයි | ඇත / නැත |
| v. | 2016 | විශිෂ්ඨයි / සාමාන්‍ය ප්‍රමාණයට වඩා ඉහළයි / සතුටුදායකයි / අසතුටුදායකයි | ඇත / නැත |
| vi. | 2015 | විශිෂ්ඨයි / සාමාන්‍ය ප්‍රමාණයට වඩා ඉහළයි / සතුටුදායකයි / අසතුටුදායකයි | ඇත / නැත |

(කරුණාකර එක් එක් වර්ෂයේ කාර්ය සාධන වාර්තාව අනුව වගු අංක 02 සම්පූර්ණ කර, අදාළ කාර්ය සාධන වාර්තාවන්හි සහතික කළ පිටපත් වර්ෂ අනුව පිළිවෙලින් අමුණන්න.)

4. නිලධාරියාට/නිලධාරිනියට විරුද්ධව කිසිදු විනයානුකූල ක්‍රියා මාර්ගයක් ගෙන **ඇති / නොමැති** බවත්,

4.1. විනයානුකූල දඬුවම් ලබා ඇත්නම්, විනය කරුණු මත සතුටුදායක සේවා කාලය අඩුවීම

වගු අංක 03

| **විනය නියෝගය** | **චෝදනා පත්‍රය අනුව වරද සිදු කළ කාල සීමාව** | **සතුටුදායක සේවා කාලය අඩුවන දින ගණන** | | |
|---|---|---|---|---|
| | | **අවු.** | **මාස** | **දින** |
| | | | | |
| | | | | |
| සේවා කාලය අඩුවන දින ගණන | | | | |

(කරුණාකර විනය තීරණ වල සහතික කරන ලද පිටපත් අමුණන්න.)

**5. නිලධාරියාට / නිලධාරිනියට එරෙහිව විනය කටයුතු ආරම්භ කිරීමට කටයුතු කරමින් හෝ විනය පරීක්ෂණ සිදු වෙමින් පවතින / නොපවතින බවත්,**

6. නිලධාරියා/නිලධාරිනිය වැටුප් රහිත නිවාඩු හෝ අඩ වැටුප් නිවාඩු ලබාගෙන **ඇති / නොමැති** බවත්,

6.1. ඉහත පරිදි නිවාඩු ලබා ගෙන ඇත්නම්, නිවාඩු ලබා ගැනීම මත සේවා කාලය අඩුවීම

වගු අංක 04

| **අනු අංකය** | **නිවාඩු අනුමැතිය සඳහා අදාළ කොන්දේසි** | **කාල සීමාව** | | **සේවා කාලය අඩුවන දින ගණන** | | |
|---|---|---|---|---|---|---|
| | | **සිට** | **දක්වා** | **අවු.** | **මාස** | **දින** |
| i. | ආයතන සංග්‍රහයේ V:2.5.4 | | | | | |
| ii. | ආයතන සංග්‍රහයේ XII:16 | | | | | |
| iii. | කළමනාකරණ සේවා චක්‍රලේඛ අංක 10 | | | | | |
| iv. | කළමනාකරණ සේවා චක්‍රලේඛ අංක 33 | | | | | |
| v. | ආයතන සංග්‍රහයේ XII: 36 | | | | | |
| vi. | වෙනත් වැටුප් රහිත නිවාඩු | | | | | |
| සේවා කාලය අඩුවන සම්පූර්ණ දින ගණන | | | | | | |

(කරුණාකර නිවාඩු අනුමත කළ ලිපි වල සහතික කළ පිටපත් අමුණන්න)

6.2. වගු අංක 03 හි සහ වගු අංක 04 හි සේවා කාලය අඩුවන දිනයන්හි මුළු එකතුව

අවු. ......................... මාස ................ දින ..................

6.3. 6.2 අනුව නිලධාරියා / නිලධාරිනිය I ශ්‍රේණියට උසස් වීමට සුදුසුකම් ලබන දිනය:- ...........................................

7. මෙම නිලධාරියා/නිලධාරිනියගේ වැඩ, පැමිණීම හා හැසිරීම **සතුටුදායක බවත් / සතුටුදායක නොවන බවත්,**

8. ........................................................................................ මහතා / මහත්මිය / මෙනවිය ................................ දින සිට ශ්‍රී ලංකා පරිපාලන සේවයේ I ශ්‍රේණියට උසස් කිරීම සුදුසු බවට, **නිර්දේශ කරමින් / නිර්දේශ නොකරමින්,**

9. නිවැරදිව සම්පූර්ණ කරන ලද අයදුම්පත ද, අදාළ ලේඛන වල සහතික කළ පිටපත් ද අමුණා සකස් කරන ලද ගොනුව මේ සමග එවමි.

............................................ 
දිනය

............................................ 
දෙපාර්තමේන්තු ප්‍රධානියාගේ අත්සන 
නිල මුද්‍රාව

*අදාළ නොවන වචන කපා හරින්න

**(ඇ) කොටස - අදාළ අමාත්‍යාංශ ලේකම් විසින් සම්පූර්ණ කළ යුතුය.**

ලේකම්, 
රාජ්‍ය සේවා, පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශය

1. ශ්‍රී ලංකා පරිපාලන සේවයේ II ශ්‍රේණියේ .................................................................................. මහතා / මහත්මිය / මෙනවිය ගේ රාජකාරී හා හැසිරීම පිළිබඳව දෙපාර්තමේන්තු / ආයතන ප්‍රධානියාගේ නිර්දේශ සමග එකඟ වෙමි / එකඟ නොවෙමි.

2. නිලධාරියාගේ / නිලධාරිනියගේ රාජකාරී, හැසිරීම, විශේෂ කුසලතා හා කාර්ය සාධනය ඇගයීමට ලක් කළෙමි. ........................................................................................ මහතා / මහත්මිය / මෙනවිය ශ්‍රී ලංකා පරිපාලන සේවයේ I ශ්‍රේණියට උසස් කිරීම **නිර්දේශ කරමි / නොකරමි**.
   නිර්දේශ නොකරන්නේ නම් එයට හේතුව,
   ....................................................................................................................................................
   ....................................................................................................................................................
   ....................................................................................................................................................

3. නිවැරදිව සම්පූර්ණ කරන ලද අයදුම්පත ද, අදාළ ලේඛන වල සහතික කළ පිටපත් ද අමුණා සකස් කරන ලද ගොනුව මේ සමග එවමි.

............................................ 
දිනය

............................................ 
අමාත්‍යාංශ ලේකම්ගේ අත්සන 
නිල මුද්‍රාව

*අදාළ නොවන වචන කපා හරින්න.